# ක්‍රිස්තියානියේ අන්තර්ගත වූ විවිධ සභා

එන්. එන්. ඊ. ලෝව්

ක්‍රිස්තියානිය ආරම්භයේ සිට ම ස්වාධීන ව පාලනය වූ සභා රාශියකින් සමන්විත වී තිබීම එහි විශේෂ ලක්ෂණයකි. වර්තමානයේ දී වුව ද ක්‍රිස්තියානි සභාව යනුවෙන් හඳුන්වා දිය හැකි එක් සභාවක් නොමැත. විවිධ නම්වලින් හඳුන්වන ලද සභා රාශියක් ක්‍රිස්තියානියට අයත් වෙයි. මෙම ලක්ෂණය සියලු ආගම්වලට පොදු වූවකි. බෞද්ධාගම ගත් විට එය ථේරවාදය, සෞත්‍රවාදය, තන්ත්‍රවාදය, අමිදවාදය වැනි නිකායයන්ට බෙදී ඇත. හින්දු ආගම ගත් කල ශිවවාදය, බ්‍රහ්මවාදය, විෂ්ණුවාදය, ශක්තිවාදය වැනි නිකායයන්ට බෙදී තිබේ. ඉස්ලාම් ආගම ගත් විට එය සුන්නිවාදය, ෂියාවාදය, සුෆිවාදය වැනි නිකායයන්ගෙන් සමන්විත වෙයි. ආගම්වල මෙවැනි ලක්ෂණයක් ඇති වීම වැළැක්විය නොහැකි දෙයකි. නමුත් ක්‍රිස්තියානියේ අන්තර්ගත වන සභා රාශිය අනිකුත් ආගම්වල තිබෙන නිකායයන් හා සසඳා බලන කල එය අතිවිශාල සංඛ්‍යාවකි. මෙතරම් සභා රාශියකින් සමන්විත වූ ක්‍රිස්තියානියේ අන්තර්ගත වන සභා සංකල්පය තේරුම් ගැනීම අනාගාමිකයෙකුට පමණක් නොව ක්‍රිස්තු භක්තිකයෙකුට වුව ද අතිශයින් දුෂ්කර කාර්යයකි.

ක්‍රිස්තියානියේ ආරම්භක ස්වරූපය හරියාකාර අවබෝධ කර නොගෙන මෙහි බහු ස්වරූපී ක්‍රමය විග්‍රහ කිරීම අසීරු කරුණකි. ක්‍රිස්තියානිය ආරම්භ වූයේ ජුදා ආගමෙන් ය. ජුදා ආගම අතීතයේ සිට පැවත එන ගෝත්‍රික ක්‍රමයේ හැම පැරණි ආගමක් මෙන් ම ජුදා යන එක් ජන කොටසකට සීමා වූ ආගමක් ය. ක්‍රිස්තියානියේ ශාස්තෘවරයා එනම් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජාතියෙන් පමණක් නොව ආගමෙන් ද ජුදෙව්වෙකු ලෙස උපත ලබා ඇත. එතුමා ජීවත් වූ කාලයේ දී ජුදෙව්වෝ ඒකදේව භක්තියට වඩා තම ජාතික හැඟීම මත ඒක ජාතිවාදී භාවයට මුල්තැන දුන්හ.

---

© එන්. එන්. ඊ. ලෝව්

සංස්. පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමි, ආර්. එම්. ඩබ්. රාජපක්ෂ, ඉන්ද්‍රා දසනායක, රෝෂාමාලා ජලද්
මානව ශාස්ත්‍ර පීඨ සංග්‍රහය, 5 කලාපය, 2008, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.